සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

## 11 ශ්‍රේණිය

## පුරවැසි අධ්‍යාපනය - I

නම/විභාග අංකය :- ............................................................................ කාලය : පැය 01යි.

**සැලකිය යුතුයි.**

- (i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- (ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති (1) (2) (3) (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- (iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

01. ක්‍රි. ව. 6 වන සියවසේ සමූහාණ්ඩුවක් ලෙස පැවති ''වජ්ජි'' ජනපදය පාලනයේ දී අනුගමනය කළේ
(1) සතර බ්‍රහ්ම විහරණ ය. (2) සප්ත අපරිහානීය ධර්ම ය.
(3) දස පුණ්‍ය ක්‍රියා ය. (4) සතර සංග්‍රහ වස්තු ය.

02. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කළ පුද්ගලයන් දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) ඒබ්‍රහම් ලින්කන්, ටයිලර් (2) සීලර්, හැරල්ඩ් ලැස්කි
(3) ඒබ්‍රහම් ලින්කන්, සීලර් (4) ටී. එච්. ග්‍රීන්, ජෝන් ඔස්ටින්

03. එක් ජාතියක් සඳහා එක් රාජ්‍යයක් යන සංකල්පය මත පදනම් වූ රාජ්‍යය හඳුන්වන්නේ
(1) ඒකීය රාජ්‍ය යනුවෙනි (2) ධනවාදී රාජ්‍ය යනුවෙනි
(3) ජාතික රාජ්‍ය යනුවෙනි (4) පොදු රාජ්‍ය යනුවෙනි

04. ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියකු සතු විය යුතු වැදගත් ගුණාංගයක් නොවන්නේ
(1) බහුතර මතයට ගරු කිරීම (2) නීති ගරුක වීම
(3) විරුද්ධ මත ඉවසීම (4) ගැටුම් ඇති කිරීම

05. මධ්‍යම ආණ්ඩුව සතු ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ප්‍රාදේශීය ආණ්ඩු වෙත පැවරීම.
(1) බලය බෙදා හැරීමයි. (2) බලය විමධ්‍යගත කිරීමයි.
(3) බලය ඒකරාශි කිරීමයි. (4) බලය පවරා දීමයි.

A - ජාතික ආරක්ෂාව තහවුරු කර ගැනීම
B - ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පැවතීම
C - රාජ්‍යයේ විශාලත්වය
D - ජනතාව පොදු හැඟීමකින් කටයුතු කිරීම

06. ඉහත ප්‍රකාශ අතුරෙන් නූතන රාජ්‍යවල බලය බෙදා හැරීමට බලපෑ හේතු ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) A හා D (2) B හා C (3) A හා C (4) B හා D

07. සන්ධීය ආණ්ඩු ක්‍රමයක් පවතින රටකි.
(1) ප්‍රංශය (2) ඕස්ට්‍රේලියාව (3) බ්‍රිතාන්‍ය (4) ශ්‍රී ලංකාව

08. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනයක මහා සභාව විසින් කරන ලද ප්‍රමුඛ කාර්යයක් වනුයේ මින් කවරක් ද?
(1) ප්‍රතිපත්ති සම්පාදනය කිරීම (2) පළාත් සභාවට සංදේශ යැවීම
(3) කෘෂිකාර්මික කටයුතු දියුණු කිරීම (4) සමාජ සේවා කටයුතු පවත්වාගෙන යාම

09. නිෂ්පාදන සාධක එකතු කර නිෂ්පාදන ක්‍රියාවලිය මෙහෙය වීම
(1) නායකත්වයයි (2) ව්‍යවසායකත්වයයි (3) කාර්යක්ෂමතාවය යි (4) පුරෝගාමීත්වය යි.

10. විවිධ සංස්කෘතීන් ගෙන් යුතු සමාජයක් බිහිවීමේලා බලපෑ සංක්‍රමණික කණ්ඩායමකි.
(1) පඬුවස්දෙව් ඇතුළු පිරිස (2) සේන ගුත්තික වෙළඳුන්
(3) පණ්ඩු පාරින්ද ඇතුළු පිරිස (4) භල්ලුක සමඟ කණ්ඩායම

11. බහු සංස්කෘතික ජන සමාජයක යහ පාලනය ක්‍රියාත්මක වීමෙන්
(1) අයිතිවාසිකම් සීමා වේ. (2) එකිනෙකා අතර අවබෝධය පුළුල් වේ.
(3) අල්ලස හා දූෂණය ඉහළ යාම සිදුවේ (4) රාජ්‍ය පාලනය අකාර්යක්ෂම වේ.

12. ''වෙනස්කම් තුළින් එකමුතු බව'' තේමාව කර ගනිමින් බහු සංස්කෘතියෙන් ප්‍රයෝජන ගත් රටකි.
(1) ප්‍රංශය (2) ස්පාඤ්ඤය (3) පෘතුගාලය (4) සිංගප්පූරුව

13. නිෂ්පාදන භාණ්ඩ ප්‍රයෝජනයට ගන්නා ආකාරය අනුව පොහොර, ඛනිජ තෙල්, දැව යන භාණ්ඩ අයත් වනුයේ
(1) අන්තර් භාණ්ඩ වලට ය. (2) පාරිභෝගික භාණ්ඩ වලට ය.
(3) ප්‍රාග්ධන භාණ්ඩ වලට ය. (4) සුඛෝපභෝගී භාණ්ඩ වලට ය.

14. පෞද්ගලික අංශයට කළ හැකි දේ රජය විසින් නො කරන රජයේ අවම මැදිහත් වීමක් මගින් වෙළඳ පොළ ක්‍රියාත්මක වීමට ඉඩ ලබාදෙන අර්ථ ක්‍රමය හැඳින්වෙන්නේ,
(1) නව ලිබරල්වාදී යනුවෙනි (2) ධනවාදී යනුවෙනි
(3) සමාජවාදී යනුවෙනි (4) මිශ්‍ර යනුවෙනි

15. මූර්ත ජාතික නිෂ්පාදනයේ වසරින් වසර සිදුවන වැඩිවීමේ ප්‍රතිශතය
(1) පුද්ගල වර්ධනයයි (2) සමාජීය වර්ධනයයි (3) ආර්ථික වර්ධනයයි. (4) පාරිසරික වර්ධනයයි

16. ගෝලීයකරණය තුළ දැකිය හැකි විශේෂ ලක්ෂණයකි.
(1) වැඩ ලෝකය පුළුල් කිරීම (2) දේශීය මුදලේ අගය ඉහළ යාම
(3) සාක්ෂරතාවය ඉහළ යාම (4) ආවෘත ආර්ථිකයක් ඇතිවීම

17. පහත I තීරුවේ සඳහන් ගැටුම් වර්ග ඇති වූ රටවල් II තීරුවේ දැක්වේ. I හා II තීරු නිවැරදිව ගැලපූ විට පිළිතුර තෝරන්න.

| | I තීරුව | | II තීරුව |
|---|---|---|---|
| 1. | දේශපාලන | A | ඉතියෝපියාව |
| 2. | වාර්ගිකත්වය | B | ඊශ්‍රායල - පලස්තීන |
| 3. | සමාජ ආර්ථික | C | අයර්ලන්ත |
| 4. | ආගමික මතවාද | D | රුවන්ඩාව |

(1) BCAD (2) CADB (3) ADBC (4) BDAC

18. ගැටුම් නිරාකරණයේ දී පුද්ගලයා තුළ පැවතිය යුතු සමාජීය ගුණාංගයක් ලෙස දැක්විය හැක්කේ මින් කවරක් ද?
(1) සහානුභූතිය (2) අවිහිංසක බව (3) ආත්මාවබෝධය (4) මුදිතාව

19. ගැටුම් ඇතිවීම නිසා රටක
(1) පරිසරය හා ස්වාභාවික සම්පත් විනාශ වේ. (2) පුද්ගලයන් තුළ ධනාත්මක ආකල්ප ඇතිවේ.
(3) ජීවිත හා දේපල සුරක්ෂිත බව ඇතිවේ (4) ජනතාවගේ ජීවන මට්ටම ඉහළයාම සිදුවේ.

20. බහු සංස්කෘතික ජන සමාජයක පුරවැසියකුගේ වගකීම වන්නේ
(1) තමන් කැමති දේශපාලන මතවාදයක් දැරීම ය. (2) යටිතල පහසුකම් සංවර්ධනය කිරීම ය.
(3) තම සංස්කෘතියට අනුව පමණක් කටයුතු කිරීම ය. (4) සියලු ම සංස්කෘතීන් ගරු කිරීම ය.

21. රාජ්‍යයක බලය ක්‍රියාවට නැංවීමේ උත්තරීතර නීතිය වන්නේ
(1) සිරිත් විරිත් ය. (2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ය.
(3) විද්‍යාත්මක සිද්ධාන්ත ය. (4) ව්‍යවස්ථාදායක අණ පනත් ය.

22. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පොදු නීතිය හැඳින්වෙන්නේ
(1) උඩරට නීතිය යනුවෙනි (2) ඉංග්‍රීසි නීතිය යනුවෙනි
(3) රෝම ලන්දේසි නීතිය යනුවෙනි (4) ජාතික නීතිය යනුවෙනි

23. අධිකරණ සේවා කොමිසමේ සභාපතිවරයා ලෙස කටයුතු කරන්නේ කවරෙක් ද?
(1) ජනාධිපති ය. (2) අග විනිසුරුවරයා ය.
(3) අධිකරණ ඇමති ය. (4) අගමැති ය.

24. සේවක හා සේවා යෝජක කණ්ඩායම් අතර ඇතිවන වෘත්තිමය ආරවුල් නීතිමය රාමුවක් තුළ විසඳා ගැනීමට ක්‍රියා කිරීම
(1) මැදිහත්කරණය යි. 2. සමථකරණය යි. 3. නිරවුල්කරණය යි. 4. බේරුම්කරණය යි.

25. රජරට, දක්ඛිණ දේශය, දොළොස් දහස් රට හා අටදහස් රට යනුවෙන් ශ්‍රී ලංකාව පාලන ඒකකවලට බෙදී පැවතුනේ
(1) අනුරාධපුර යුගයේ දී ය. (2) බ්‍රිතාන්‍ය පාලන යුගයේ දී ය.
(3) පොළොන්නරු යුගයේ දී ය. (4) මහනුවර යුගයේ දීය.

26. A ජාතික රාජ්‍ය සභාව ඇති කිරීම
B විධායක ජනාධිපති ධුරය හඳුන්වා දීම
C සමානුපාතික නියෝජන ක්‍රමය ඇති කිරීම
D රට සභා හඳුන්වා දීම
ඉහත සඳහන් ප්‍රකාශ අතුරෙන් 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා සම්බන්ධ වන ප්‍රකාශ ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) A හා B (2) B හා C (3) C හා D (4) A හා C

27.

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. ප්‍රථමයෙන් ඡන්දබලය ලබාදීම | A 1931 ඩොනමෝර් |
| 2. පළාත් බද ඡන්ද කොට්ඨාස ක්‍රමය | B 1910 කෲව් මැකලම් |
| 3. විධායක කාරක සභා ක්‍රමය | C 1947 සෝල්බරි |
| 4. ද්වි මණ්ඩල පාර්ලිමේන්තුව | D 1921 මැනිං |

ඉහත I තීරුවේ සඳහන් ප්‍රතිසංස්කරණ ලබාදුන් ආණ්ඩුක්‍රමය II තීරුවේ සඳහන්ය. I හා II තීරු නිවැරදිව සකස් කළ විට ලැබෙන පිළිතුර කුමක් ද?
(1) B D A C (2) D A B C (3) C D A B (4) B D C A

28. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30 (1) ව්‍යවස්ථාවේ සඳහන් වන්නේ කවර තනතුර පිළිබඳව ද?
(1) අගමැති ධුරය (2) ආණ්ඩුකාර ධුරය (3) ජනාධිපති ධුරය (4) අග්‍රාණ්ඩුකාර ධුරය

29. 1865 මහ නගර සභා ආඥා පනත යටතේ ශ්‍රී ලංකාවේ ප්‍රථමයෙන් පිහිටු වූ මහ නගර සභා දෙකක් වන්නේ
(1) ගාල්ල, දෙහිවල (2) මහනුවර, මාතර (3) කොළඹ, මහනුවර (4) මොරටුව, බදුල්ල

30. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සකස් කිරීමේ දී පදනම් කරගත් විශේෂ අරමුණු වන්නේ ළමයාගේ,
(1) ආරක්ෂාව, පැවැත්ම, සංවර්ධනය, සහභාගිත්වය
(2) ආරක්ෂාව, දක්ෂතාවය, ආදරය, හැකියාව
(3) සංවර්ධනය, අභිමානය, ගුණාත්මක බව, ආරක්ෂාව
(4) සහභාගිත්වය, රැකවරණය, සාමූහිකත්වය, පෝෂණය

31. කාන්තාවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ගයකි.
(1) කාන්තාවන්ට වෘත්තීය පාඨමාලා හඳුන්වා දීම (2) "සීඩෝ" සම්මුතිය සකස් කිරීම
(3) කාන්තා කටයුතු අමාත්‍යාංශයක් පිහිටුවීම (4) කාන්තා දිනයක් ප්‍රකාශයට පත්කිරීම.

32. 1989 දී ආදිවාසි හා ගෝත්‍රික ජනතාව පිළිබඳ සම්මුතිය හඳුන්වා දෙන ලද්දේ කවර සංවිධානය විසින් ද?
(1) ලෝක සෞඛ්‍ය සංවිධානය (2) ලෝක කම්කරු සංවිධානය
(3) සාර්ක් සංවිධානය (4) උන්ක්ටාඩ් සංවිධානය

33. පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ප්‍රධාන නීතිය කුමක් ද?
(1) 1979 මහවැලි අධිකාරි පනත (2) 1895 කැලෑ ආඥා පනත
(3) 1988 ජාතික උරුම වන භූමි පනත (4) 1980 ජාතික පරිසර පනත

34. පුරවැසි අයිතිවාසිකම් හා බැඳුණු නීතිමය යුතුකම් සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශය කවරක් ද?
(1) ත්‍රස්තවාදය පිටු දැකීමට ක්‍රියාකිරීම (2) රජය විසින් පනවන බදු ගෙවීම
(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීම (4) ජාතික උරුමයන් හා සම්පත් සුරැකීම

35. පරිසරයේ දක්නට ලැබෙන ශාක හා සතුන් අයත් වන්නේ කවර ගණයට ද?
(1) ජෛව සංරචක වලට ය. (2) අජෛව සංරචක වලටය.
(3) පරිසර සම්පත් වලටය. (4) උපකාරක සංරචක වලටය.

36. පාරිසරික ගැටලු ඇති වීමට බලපාන ප්‍රධානතම හේතුවකි.
(1) සම්පත් ක්ෂය වී යාම (2) සම්පත් අධි පරිභෝජනය
(3) අවිධිමත් පතල් කැනීම (4) වනාන්තර විනාශ කිරීම

37. සෞඛ්‍ය සම්පන්නව ජීවත්වීම, දැනුම මට්ටම සහ ජීවන තත්ත්වය යන පැතිකඩ තුනම මැනීමට වඩාත් සුදුසු වන සංවර්ධන මිනුම කුමක් ද?
(1) මානව පීඩන දර්ශකය
(2) මානව සංවර්ධන දර්ශකය
(3) මානව දරිද්‍රතා දර්ශකය
(4) බහුමාන දරිද්‍රතා දර්ශකය

38. සංවර්ධනය වෙමින් පවතින රටවලට සංවර්ධනයේ දී මුහුණපාන ගැටළු සඳහා විසඳුම් ලෙස ගත හැකි ක්‍රියා මාර්ගයක් වන්නේ
(1) දේශීය ඉතුරුම් දිරිගැන්වීම
(2) ප්‍රාථමික භාණ්ඩ මිළ ඉහළ දැමීම
(3) භාණ්ඩ ආනයනය දිරි ගැන්වීම
(4) කර්මාන්තශාලා ප්‍රමාණය වැඩි කිරීම

39. භෞතික ජීවන තත්ත්ව දර්ශකය සැකසීමට භාවිතා කරන සංරචක මොනවා ද?
(1) දළ ජාතික නිෂ්පාදිතය, ක්‍රය ශක්තිය, ගම්‍ය මිළ දර්ශකය
(2) අධ්‍යාපනය, උපතේදී ආයු අපේක්ෂාව, ක්‍රය ශක්තිය
(3) සාක්ෂරතාව, උපතේදී ආයු අපේක්ෂාව, ළදරු මරණ අනුපාතය
(4) මූර්ත ආදායම, ඒක පුද්ගල ආදායම, සාක්ෂරතාව

40. පරිසරයෙන් ලැබෙන සේවාවන් අතරින් ආර්ථික උපයෝගිතා සේවාවලට අයත් වන දෑ පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) හිරු එළිය, වාතය, ජලය,
(2) ජල විදුලිය, වාතය, ජලය
(3) භූමිය, පොසිල ඉන්ධන, ඛණිජ සම්පත්
(4) ජීව වායු, භූ තාපය, ජලය

(ලකුණු 1 × 40 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

## 11 ශ්‍රේණිය

## පුරවැසි අධ්‍යාපනය - II

නම/විභාග අංකය :- ..................................................... කාලය : පැය 02 යි.

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. (i) ජාතික රාජ්‍යයක ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
(ii) ඍජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමාන ලෝකයේ ක්‍රියාත්මක නොවීමට බලපෑ හේතු දෙකක් ලියන්න.
(iii) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය අනුව ශ්‍රී ලංකාවේ පළාත් සභාවලට බලතල පවරා ඇති ලැයිස්තු දෙකක් නම් කරන්න.
(iv) බහු සංස්කෘතික ජන සමාජයක මූලික ලක්ෂණ දෙකක් ලියන්න.
(v) ධනවාදී ආර්ථික ක්‍රමයක ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
(vi) ගැටුම් නිරාකරණය සඳහා භාවිතා කරන ක්‍රමවේද දෙකක් නම් කරන්න.
(vii) දේශීය නීතියේ ප්‍රභේද දෙකක් සඳහන් කරන්න.
(viii) ශ්‍රී ලංකාවේ ඔම්බුඩ්ස්මන් වරයාගෙන් අපේක්ෂා කරන ප්‍රධාන කාර්යයන් දෙක ලියන්න.
(ix) ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියා මාර්ග දෙකක් ලියන්න.
(x) සමාජ පරිසරයට හානි සිදු වීම නිසා ඇතිවන ප්‍රතිඵල දෙකක් සඳහන් කරන්න (ලකුණු $2 \times 10 = 20$)

02. (i) රාජ්‍යයන්ගේ ප්‍රධාන ස්වරූප දෙක නම් කරන්න. (ලකුණු 02)
(ii) ආණ්ඩුව සමන්විත වන ආයතන තුන සඳහන් කරන්න. (ලකුණු 03)
(iii) ජනාධිපති ආණ්ඩු ක්‍රමයක ලක්‍ෂණ තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

03. (i) නිෂ්පාදන සාධකවලින් දෙකක් නම් කරන්න. (ලකුණු 02)
(ii) ඕනෑම ආර්ථිකයක සිදුවන ප්‍රධාන ක්‍රියාවලින් තුන සඳහන් කරන්න. (ලකුණු 03)
(iii) වර්තමාන ශ්‍රී ලංකාවේ සිදු වෙමින් පවතින සංවර්ධන ක්‍රියාවලින් අත්වන වාසි තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

04. (i) සන්ධීය රාජ්‍යයක ලක්‍ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)
(ii) සන්ධීය රාජ්‍යයක පැවැත්ම සඳහා අවශ්‍ය වන ගුණාංග තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)
(iii) සන්ධීය ආණ්ඩු ක්‍රමයක යහපත් ලක්‍ෂණ තුනක් ද අයහපත් ලක්‍ෂණ දෙකක් ද ලියන්න. (ලකුණු 05)

05. (i) ශ්‍රී ලංකාවේ පොදු නීතියට අමතරව ක්‍රියාත්මක වන වෙනත් නීති වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 02)
(ii) නීතියේ ආධිපත්‍යය පවත්නා සමාජයක දැකිය හැකි ලක්‍ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)
(iii) අප්‍රමාදව හා අපක්ෂපාතීව යුක්තිය පසිඳලීම සිදු නොවීම නිසා ඇතිවිය හැකි අවාසි තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

06. (i) වර්තමාන ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන දෙකක් නම් කරන්න. (ලකුණු 02)
(ii) ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවලට පැවරී ඇති කාර්යයන් ඇතුළත් වන ප්‍රධාන තේමා තුන සඳහන් කරන්න. (ලකුණු 03)
(iii) පළාත් පාලන ආයතනවල ප්‍රයෝජන තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

07. (i) භෞතික පරිසරයට හානි සිදු කරන ස්වාභාවික සංසිද්ධීන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)
(ii) ජල දූෂණය නිසා ඇතිවිය හැකි ගැටලු තුනක් ලියන්න. (ලකුණු 03)
(iii) ශිලා ගෝලයට හානි පමුණුවන මිනිස් ක්‍රියාකාරකම් තුනක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)